# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1975/43 – 2016 ජූලි 13 වැනි බදාදා – 2016.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළය සුළු කොට්ඨාසයේ, කොටපොල (අ.ග.පි.45) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මාර/කේටීපී/2003/580 හා 2003.09.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් කැබලි අක්ෂර 'ඒ' හා 'බී' ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 2.018ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – කිරිවානගහවත්ත ක්ෂේත්‍ර අංක 2ඒ – ප්‍රමාණය: හෙක්. 0.694**

උතුරට: මෙම ඉඩමේ කොටසක් සහ කැබලි අංක 1532; නැගෙනහිරට: මෙම ඉඩමේ කොටසක් සහ මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය, කැබලි අංක 180ඩී 2 සහ මෙම ඉඩමේ කොටසක්.

**02. කැබලි අක්ෂර 'බී' – කිරිවානගහවත්ත ක්ෂේත්‍ර අංක 2ඒ – ප්‍රමාණය: හෙක්. 1.324**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මෙම ඉඩමේ කොටසක්; දකුණට: මෙම ඉඩමේ කොටසක් සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: LD/05/2003/VEP/484.
2016 ජූනි මස 14 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 1109

1A – G23833 – 22 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*